**ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124 (2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 106 - ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 12 දින අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විසතරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.3 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම | 1. ක්‍රියාකාරී සැලැස්මේ පවතින අඩුපාඩු නොතිබුණි. | 2.1.1 |
| | | 2. ප්‍රසම්පාදන සැලැස්මේ පවතින අඩුපාඩු | 2.2.1 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.9 |
| | | 4. මානව සම්පත් කළමනාකරණයේ අඩු පාඩු | 2.11 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ දුර්වලතා | 2.5 |
| | | 2. අනුකූල නොවීම් | 2.10 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ප්‍රධාන කාර්යයන් සීමා වීම | 2.3.2 |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.2 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්ණ තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. ප්‍රගතිවාර්තාවල පවතින අඩුපාඩු | 2.3.1 (ඇ),(ඈ),(ඉ) |
| | | 2. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.6 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරිම. | 2.7 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.8 |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතුනිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවේ | 1. පාඩු හා හානි | 2.6 |
| | | 2. මුදල් සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබා නොගැනීම | 2.12 |

පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම.

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------

### 2.1 කාර්යසාධනය

----------------

#### 2.1.1 සැලැසුම් කිරිම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඇ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ සංශෝධිත ක්‍රියාකාරී සැළැස්මේ දක්වා තිබුණු රු.මිලියන.129.57 ක්වූ පුනරාවර්තන ප්‍රතිපාදනය සම්බන්ධ තොරතුරු ප්‍රගති වාර්තාව තුල ඇතුලත් කර නොතිබුණි.

(ඈ) සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රාග්ධන අයිතම යටතේ සඳහන් අමාත්‍ය කාර්යාලයට අදාල රු.මිලියන 6.15 ක්වූ ප්‍රතිපාදනය හා අමාත්‍යාංශයට අදාල රු.මිලියන 14 ක්වූ ප්‍රතිපාදනය සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු ලබාදී නොතිබුණ අතර ප්‍රගති වාර්තාව තුල එම මිලදී ගැනීම් සඳහන් කර නොතිබුණි.

(ඉ) ක්‍රියාකාරී සැළැස්ම අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවීම සඳහා පාර්ලිමේන්තු පනත සකස් කර අවසන් කරන බව සඳහන් කර තිබුනද සමාලෝචිත වර්ෂය අවසාන දින වනවිටත් අදාල කටයුතු මන්දගාමීව පැවති බව නිරීක්ෂණය විය.

#### 2.1.2 කාර්යභාරයන් සීමා වීම

------------------------

2017 ජූලි 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2016(11) අනුව ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රක්ෂණ ප්‍රතිලාභ ලබා දීම සඳහා ආපදා හානි සම්බන්ධ තක්සේරු වාර්තා හා අනෙකුත් සියලු විස්තර ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ඉදිරිපත් කිරීම වෙනුවට අදාළ තක්සේරු වාර්තා හා අනෙකුත් සියලු විස්තර අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සෘජුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත යැවිය යුතු බවත් එම තොරතුරු පදනම් කරගෙන ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අදාළ රක්ෂණ ප්‍රතිලාභ නිදහස් කිරීම සිදුකළ යුතු බවට උපදෙස් දී තිබුණි. මේ හේතුවෙන් ස්වභාවික ආපදා වෙනුවෙන් වන්දි ගෙවීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ විෂය පථය සීමාවී තිබුණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ හා පරිපූරක අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් පහත සඳහන් වැය විෂයයන්ට අදාළව සලසා ගෙන තිබුණු රු. මිලියන 1669.1 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 1389.6 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|---|
| | | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| | | **සැපයීම්** | | | |
| 1201 | - | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 5.3 | 5.2 | 0.1 |
| 1203 | - | ආහාර පාන හා නිල ඇඳුම් | 0.08 | 0.08 | - |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | |
| 2101 | - | වාහන | 615.00 | 431.6 | 183.4 |
| 2102 | - | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 9.56 | 9.34 | 0.22 |
| 2103 | - | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 74.98 | 74.92 | 0.06 |
| 2104 | - | ගොඩනැගිලි ඉදිකිරීම | 964.18 | 868.46 | 95.72 |
| | | එකතුව | 1669.10 | 1389.6 | 279.5 |

### 2.2.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයිම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 1669.1 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 1389.6 ක් උපයෝජනය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) මාර්ගෝපදේශය පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කරනු ලැබිය යුතු වුවත් එසේ කර නොතිබුණි.

### 2.2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 174.9 ක් වූ ට්‍රැක්ටර් බවුසර් 100ක් හා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 105 ක්වූ ලොරි බවුසර් 20 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් සිදුකළ ට්‍රැක්ටර් බවුසර් 100ක් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරඟකාරී පදනම මත ලංසු කැඳවීම සිදුනොකර

එහි 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව තෝරාගත් දේශීය සැපයුම් කරුවන්ගෙන් සීමිත මිල කැඳවීම් සිදුකර තිබුණි.

(ii) ට්‍රැක්ටර් බවුසර් ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් පළමුව මිල කැඳවීම් ලබා දී නොතිබුණු ආයතන 03 ක් සඳහා නැවත මිල කැඳවීම් නිකුත් කර ඉන් ආයතනයක් ප්‍රසම්පාදන කටයුතු තෝරා ගෙන තිබුණි. මේ හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රමවේදය විනිවිදභාවයෙන් තොරව සිදුකර තිබෙන බව නිරීක්ෂණය විය.

(iii) ට්‍රැක්ටර් බවුසර් 100 ක් සැපයීමේ ඇනවුම සම්පූර්ණ කළ යුතු දිනය අවස්ථා 02 කදී දීර්ඝ කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.3 මාර්ගෝපදේශය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් සකස් කළ කොන්ත්‍රාත් කොන්දේසිවල ඒ සඳහා ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු බැවින් ඉහත තත්වය උද්ගත වී තිබුණු බව නිරීක්ෂණය විය.

(iv) ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 105 ක් වූ ලොරි බවුසර් 20 ක් මිලදී ගැනීමේ කොන්ත්‍රාත්තුව සඳහාවූ සැපයුම්කරු ජාතික තරඟකාරී ක්‍රමවේදයට අනුව ලංසු කැඳවීමකින් තොරව තෝරාගෙන තිබුණි.

(v) පළමුව මිලදී ගත් ආයතනවලින්ම නැවතත් ට්‍රැක්ටර් බවුසර් 25ක් මිලදී ගෙන තිබුණු අතර ඒ අනුව මුළු ට්‍රැක්ටර් බවුසර් 125 සහ ලොරි බවුසර් 20 ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණු අතර ඒවා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කර තිබුණද අදාල ට්‍රැක්ටර් බවුසර් හා ලොරි බවුසර් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් විධිමත්ව භාරගෙන නොතිබුණි.

(ආ) ස්වයංක්‍රීය වර්ෂාමාන 100 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) මුදල් රෙගුලාසි මාරු පත්‍ර අංක 882 මගින් 2017 දෙසැම්බර් 21 දින භාණ්ඩාගාර අනුමැතිය මත රු.මිලියන 53 ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වැය විෂයයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වැය විෂයයට මාරු කර තිබුණද එම ආයතනයට ප්‍රතිපාදන නිදහස් කර නොතිබුණි. එසේ වුවද, කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් විධිමත් අනුමැතියකින් තොරව මෙම ප්‍රතිපාදනයෙන් ස්වයංක්‍රීය වර්ෂාමාන මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.

(ii) කෙසේ වෙතත්, වර්ෂාමාන, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ගබඩාව වෙත 2017 දෙසැම්බර් 28 දින වන විටත් ලැබී නොතිබුණි. ස්වයංක්‍රීය වර්ෂාමාන මිලදී ගැනීම සඳහා වියදම රු.37,052,906 ක් වූ අතර එය මෙම අමාත්‍යාංශයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම වියදමින් රඳවා ගැනීම් ලෙස රු.3,705,290 ක් පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණි. සැපයුම්කරුවන් වෙත ගෙවීම සඳහා වූ රු.33,347,615 චෙක්පත 2018 වර්ෂයේ මාස 4 ක පමණ කාලයක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් රඳවාගෙන තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමේ වියදම හා පොදු තැන්පත් ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. තවද, මේ හේතුවෙන් වර්ෂය අවසානයට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු මුදලක් ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණු බවද නිරීක්ෂණය විය. එසේම, 2017 දෙසැම්බර් 31 දින වන විට ස්වයංක්‍රීය වර්ෂාමාන මිලදී ගැනීම සඳහා ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.15,947,094 ක් ඉතිරිවී තිබුණු බවද නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු වල ස්වභාවය හා පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව රු.9,880,000 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත 2017 දෙසැම්බර් 27 දින ගෙවා තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.3.6 හා 6.3.7 මාර්ගෝපදේශයන් ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කටයුතු පිළිබඳ නියමිත ආකෘති පත්‍රයක වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කල යුතු වුවද රු.989,000 ක ඡායා පිටපත් යන්ත්‍ර 2 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී එසේ කටයුතු කර නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

---------------------------.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 හි 3.1.6 ඡේදය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 මාර්තු 17 දිනට ඉදිරිපත් කළ යුතු වුවත් එම වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 25 දිනදීය.

.

**2.4 හානි පිළිබඳ වගකීම**

ඉන්දුනීසියානු රජයෙන් 2017 වර්ෂයේ දී නියං ආධාර වශයෙන් ලැබී තිබුණු සහල් මෙට්‍රික්ටොන් 5000 මිනිස් පරිභෝජනයට නුසුදුසු වීම හේතුවෙන් සත්ව ආහාර නිෂ්පාදනය සඳහා අලෙවි කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත් මිලදී ගැනීම සඳහා එළඹි ගිවිසුම අදාළ ගැණුම්කාර ආයතනය විසින් කඩ කර තිබුණ නමුත් රු. මිලියන 22.57 ක් වූ කාර්ය සාධන සුරක්ෂණයේ වටිනාකමින් සියයට 50ක් ගිවිසුම කඩකළ ගැණුම්කාර ආයතනය වෙත ගෙවා තිබුණි. සත්ව ආහාර නිෂ්පාදනය සඳහා අලෙවි කරන ලද සහල් සත්ව ආහාර නිෂ්පාදනය සඳහාම යොදාගනු ලබන බව තහවුරු කිරීම සඳහා පසු විපරමක් අමාත්‍යාංශය මගින් සිදු නොකිරීම නිසා එම සහල් තොගය මිනිස් පාරිභෝජනය සඳහා වෙළඳ පොළට පැමිණීමේ අවදානමක් පැවති බව නිරීක්ෂණය විය.

**2.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් පැදුරු මිලදී ගැනීමේදී රු.මිලියන 1.10 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) හදිසි ආපදාවකදී මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) කටුවන හා වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පිළිවෙලින් නායයෑම් අධි අවදානම් කලාපවල ජීවත්වන පවුල් සඳහා ස්ථිර නිවාස ඉදිකිරීම සඳහා ලබාදුන් ප්‍රතිපාදනයෙන් සියයට 28ක් හා සියයට 38 වැනි අවම ප්‍රමාණයකින් ප්‍රතිලාභින් වෙත ගෙවීම් කර තිබුණි.

(ඈ) 2017 ජූලි 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ගංවතුර නාය යෑම් හා අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරන පවුල් නැවත පදිංචි කිරීම සඳහා දිස්ත්‍රික්ක නම් කර තිබුණු අතර ඊට ඇතුළත් නොවූ ගාල්ල දිස්ත්‍රික්කයේ එම කටයුතු සඳහා රු.මිලියන 119.2 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

(ඉ) නිවාස සැලසුම් වෙනුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ හා අදාළ පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලැබීමට ප්‍රථමයෙන් ඇල්පිටිය හා නාගොඩ ප්‍රාදේශීය කාර්යාල විසින් පළමු වාරිකය වූ රු.200,000 බැගින් ප්‍රතිලාභීන් 27 දෙනෙකු වෙත ලබා දී තිබුණි. අවදානම් සහගත ඉඩම් සහ රජය විසින් පවුල් නැවත පදිංචි කිරීම සඳහා තෝරාගත් ඉඩම් වලට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ ලබා දීමේ ප්‍රමාදය නිසා සමස්ථ ව්‍යාපෘතියේම ප්‍රගතිය අඩාල වී තිබුණු බව හා ගාල්ල දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ලබා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය ඉතාමත් දුර්වල ප්‍රගතියක් පෙන්වා තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඊ) ගං වතුර නාය යෑම් හා අධි අවදානම් හේතුවෙන් තම පදිංචි ස්ථානවලින් ඉවත් කරන පවුල් නැවත පදිංචි කිරීමේදී රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 19 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

(උ) බලංගොඩ, කහවත්ත, කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 වෙත ලබා දුන් ප්‍රතිපාදනවලින් කිසිවක් වැයකර නොතිබුණු අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් ප්‍රමාණය සියයට 10 ක් තරම් වූ අඩු ප්‍රමාණයක් උපයෝජනය කර තිබුණි.

(ඌ) ප්‍රතිලාභියා සතු ඉඩමක රජයේ මූල්‍යාධාර මත නිවසක් ඉදි කිරීම සඳහා අයගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් දෙදෙනෙකු සඳහා පමණක් 2017 දෙසැම්බර් 06 දින සිට ගෙවීම් කර තිබුණු අතර තෝරාගත් අනෙක් ප්‍රතිලාභීන් 85 දෙනෙකු සඳහා කිසිදු වාරික මුදලක් ගෙවා නොතිබුණි. තවද නිවස සහිත ඉඩමක් මිලදී ගැනීම සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක ප්‍රතිලාභීන් 116 දෙනෙකු තෝරාගන තිබුණු නමුත් 2017 දෙසැම්බර් 06 දිනවන විට ප්‍රතිලාභීන් 112 දෙනෙකු සඳහා කිසිදු වාරික මුදලක් ගෙවා නොතිබුණි.

(එ) රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 ක ඉඩම් මිලදී ගැනීම සඳහා සහ නිවස ඉදිකිරීම සඳහාද ප්‍රතිලාභීන් 362 ක් සඳහා මූල්‍යාධාර ලබා දීමට නියමිතව තිබුණි.කෙසේ නමුත්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිලාභින් 323 දෙනෙකු සඳහා ඉඩම් මිලදී ගැනීමටත් ප්‍රතිලාභීන් 358 දෙනෙකු සඳහා නිවාස ඉදිකිරීමටත් මූල්‍යාධාර ලබාදී නොතිබුණි.

(ඒ) රජයේ ඉඩමක රජයේ මූල්‍යාධාර මත නිවාස ඉදිකිරීම සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ තෝරාගෙන තිබුණු ප්‍රතිලාභීන් 878 ක් සඳහා කිසිදු මූල්‍යාධාරයක් ගෙවා නොතිබුණි.

(ඔ) 2107 වර්ෂය තුල අධික සුළඟ සහ නායයෑම් හේතුවෙන් හානියට පත්වූ නිවාස 14ක හිමිකරුවන් සඳහා අත්තිකාරම් මුදලක් ලෙස ගෙවීම් කිරීමට අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.140,000 ක් ලබාදී තිබුණු අතර රු.75,000 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවීම් කර නොතිබූ අතර එම මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණි.

(ඕ) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2016 වර්ෂයට පෙර ආපදාවට ලක්වූවන් සඳහා බෙදා දීමට ලැබුණු භාණ්ඩ වලින් බෙදා නොහැර ඉතිරිවූ තිබූ භාණ්ඩ ගබඩාව තුල අක්‍රමවත්ව ගොඩගසා තිබුණි. තවද, එම භාණ්ඩ විනාශ වෙමින් පවතින බව නිරීක්ෂණය වූ අතර වටිනාකම හඳුනා ගත හැකිවන පරිදි ලේබන නඩත්තු කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුලදී හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විවිධ ආපදාවන්ට ලක්වූ පුද්ගලයන් විසින් තමන්ට සිදුවූ ආපදාව පිළිබඳව කරන ලද ඉල්ලීම් 52 ක් ඉදිරිපත් කර තිබූ අතර එයින් ඉල්ලීම් 42ක් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයන් පිළිබඳව ආපදා සිදුවීම් වාර්තා කරන ලේඛනයේ සටහන් කර නොතිබුණි.

## 2.6 මහජනයා වෙත සේවා ඉටු කිරිම

2016 වර්ෂයෙදී උද්ගතවූ හදිසි ආපදා තත්වයන්ගෙන් විපතට පත් ජනතාවට සහන සැපයීම සඳහා මහජන ආධාර එකතු කිරීම සඳහා ලංකා බැංකුවේ බැංකු ගිණුමක් ආරම්භ කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ රු.මිලියන 132.22 ක ශේෂයක් පැවතුණු අතර විපතට පත් ජනතාවට කිසිදු ආධාරයක් ලබා දී නොතිබුණ බැවින් එම බැංකු ගිණුම ආරම්භ කිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 551 | 467 | 84 | 15 |
| | මූලධන | 1,231 | 1,054 | 177 | 14 |
| | **එකතුව** | **1,782** | **1,521** | **261** | **15** |
| 2014 | පුනරාවර්තන | 985 | 966 | 19 | 2 |
| | මූලධන | 3,271 | 3,065 | 206 | 6 |
| | **එකතුව** | **4,256** | **4,031** | **225** | **5** |
| 2015 | පුනරාවර්තන | 1,293 | 733 | 560 | 43 |
| | මූලධන | 2,209 | 1,752 | 457 | 21 |
| | **එකතුව** | **3,502** | **2,485** | **1,017** | **29** |
| 2016 | පුනරාවර්තන | 741 | 661 | 80 | 11 |
| | මූලධන | 4,648 | 3,478 | 1,170 | 25 |
| | **එකතුව** | **5,389** | **4,139** | **1,250** | **23** |
| 2017 | පුනරාවර්තන | 8,898 | 6,974 | 1,924 | 22 |
| | මූලධන | 7,540 | 5,095 | 2,445 | 32 |
| | **එකතුව** | **16,438** | **12,069** | **4,369** | **27** |

**විසර්ජන ගිණුම**

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු. 50,793,500 මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 39 සිට සියයට 99 දක්වා අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 10601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් දෙපාර්මේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයයන් පහත දැක්වේ.

| <u>වියදම්</u> | | <u>ලැබීම්</u> | | <u>හර ශේෂය</u> | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 20.00 | 18.99 | 4.50 | 7.62 | 42.00 | 28.65 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.344,435 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 මාස 06 ක සිට වර්ෂ 3 මාස 06 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වි තිබුණි.

## 2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය /මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි | යාවත්කාලින කර නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| ඇප තැන්පත් ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි |
| වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645 (අ) | යාවත්කාලීන කර නොතිබුණි |

## 2.10 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති, සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (i) | 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනත | ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් මූලික ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ අධිකාරිය වන ආපදා කළමනාකරණ සභාව 2017 වර්ෂයේදී රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ii) | -එම- | ජාතික ආපදා අවස්ථාවකදී පුද්ගලයින් හා දේපල බේරා ගැනීම සම්බන්ධව ජාතික ප්‍රතිපත්ති පිළියෙල කිරීම සඳහා වූ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි. |

## 2.11 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 235.40 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ෂය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 18 | 06 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 03 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 445 | 400 | 45 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 47 | 41 | 06 |
| | එකතුව | 521 | 462 | 59 |

## 2.12 රජයේ නිලධාරීන් ඇප තැබීම

රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම, හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාළ වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් ඇප තැබීම් කර නොතිබුණි.